බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මෙහි සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර - අභ්‍යන්තර විගණක ( M M 1-1 ) - තනතුරු 01

**සුදුසුකම්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය/ගණකාධිකරණය/වාණිජ්‍ය පිළිබඳ උපාධිය

සමඟ

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක /සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක වසර 03 ක විගණනය පිළිබඳ පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 - MM 1-1
රු.53,175/= -1,375x10:1,910x15 - රු.95,575/=

**වයස් සීමාව** - අවු. 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

විවෘත තරඟ විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්
විවෘත තරඟ විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

භාෂා ප්‍රවීණතාවය

ප්‍රකාශනය,අවබෝධය අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ රීති භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාවන් මැන බැලීම.

අභියෝගතා පරීක්ෂණය

තනතුරට අදාල කාර්යයන් මනාව ඉටුකිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝගතාව සහ හැකියාව මැන බැලීම.

**තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි**

සේවයේ තනතුරේ II ශ්‍රේණියට පත් කරනු ලබන නිළධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක විය යුතුය.

## තනතුර - විදුලි කාර්මික ( PL 3 ) - තනතුරු 01

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් සමත්ව තිබිය යුතුය.

**ශිල්පීය නිපුණතා**

විදුලි කාර්මික තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 - PL 3
රු.26,290/= -270x10:300x10:330x10:350x12 - රු.39,490/=

**වයස් සීමාව** - අවු. 18 ට නොඅඩු සහ අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** - වෘත්තීය හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි**

සේවයේ තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලබන සේවකයෙකු තුන් වසරක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක විය යුතුය.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් සහ යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් සිය අයදුම්පත් සමඟ අමුණා එවිය යුතුය.

1. අධ්‍යාපන සහතිකවල පිටපත්
2. උප්පැන්න සහතිකයේ පිටපතක්
3. පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත්

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

I. ඉහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ අයදුම්පත් 2021/03/23 දිනට පෙර, සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක. 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර හෝ බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුව හොත් ඔබ මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු සේ සලකනු ඇත.

**සභාපති**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.